
# ආවාට ගියාට ගොවිතැන් කරන්න එපා

නෙල්සන් විතානදූරගේ විසිනි.*

ප්‍රදේශයේ ගොවිපල සෑහෙන ප්‍රමාණයක ඇවිද්ද මට රන්බණ්ඩා මහතා ගේ ගොවිපලෙහි අමුත්තක් දක්නට ලැබුණි. ගොවිපල පිළිබඳ තොරතුරු නොපැකිල එක දිගටම ඔහු පවසා ගිය අයුරින් ඔහු ආවාට ගියාට ගොවිතැන් කරන්නකු නොවන බවක් පැහැදිලි විය. හැන්දෑවන විට තවත් ගොවියන් කිහිප දෙනෙකුත් රන්බණ්ඩා මහතා සමඟ කථාවට වැටුනේ ඔහු ගෙන් උපදෙස් ලබා ගන්න වගේ යන හැඟීමක් මට ආවා. ඔහුගේ අදහස් රටේ අනෙක් ගොවි මහතුන්ටත් ප්‍රයෝජනවත් විය හැකි නිසා මෙහෙම ඉදිරිපත් කරන්න හිතුණා.

හිටවන්නේ නෑ. අනික් කරදරේ තමයි සල්ලි අතේ තියෙන හැටියට තමයි වගාවත්. කුලියත් හරි ගණන් නිසා. තියෙන ගණනේ හැටියට යොදවන මිනිස්සු සීමා කර ගන්න වෙනවා. ඊට පස්සේ දෙයියනේ කියලා වැඩේ පටන් ගන්නවා. **අතේ තියෙන සල්ලි, ඉන්න මිනිස්සු, භෝග ආදායම බලල තමයි, ඉඩම වුනත් භෝගවලට බෙදෙන්නේ.**

ඊළඟට ඉතින් භෝගය තෝරන හැටි. ඉස්සර අපි ඔහේ වී ටික ඉහළ දැම්මා. දැන් මම කන්න පහ හයකින් ම වී වැපුරුවේ නැහැ. දැන් වී ජාතිත් ඕනෑ තරම්. ඉතින්



කන්නයක් පටන් ගන්න ඉස්සෙල්ල මම වැඩි ලාභයක් ගන්න පුළුවන් බෝග කිහිපයක් තෝරා ගන්නවා. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ උපදෙස් හා පත්‍රිකාවල තියෙන අස්වනු, ප්‍රමාණ වගේ දේ හා අවුරුදු ගණනක් උදැල්ල බද ගත්ත එකේ පළපුරුද්දත් ඇතුව තමයි ඒවා තෝරා ගන්නේ. කාලගුණයත් හරි වැදගත් වෙනව. මම ගිය ගමන රතු ළූණු හිටෙව්වා. ඒක වැස්සට ගියා. මේ සැරේ ඒ වගේ මෝඩකම් කරන්නේ නැහැ. කාල ගුණය ගැන ටිකක් හිතුවා නම් ඒවා

එක් එක් කාලයට වැඩි අස්වැන්න දෙන වී ජාති ඔය දෙපාර්තමේන්තුව කියල දෙනවනේ පේලියට පැල හිටුවනවා. එතකොට අතින් හරි රොටරියෙන් හරි වැල් පල උදුරා ගන්නත් හරි පහසුයි. හීය වැඩ කොරද්දී ඉස්සර මී හරක් තමයි වැඩිය ගත්තේ. ගිය ගමන වැස්ස පමා වෙලා. පොලොව තද උනා. පස්සේ ට්‍රැක්ටරයක් දලා හැවා. මේ ගමන කරදරයක් නැහැ. වැස්ස තිබුණනේ. ඉතින් මී හරක් දමල හැවා. ට්‍රැක්ටර කාරයෝත් දැන් ගිණි ගණන්ම නේ, ඉල්ලන්නේ. වියදම

* පර්යේෂණ හා පුහුණු කිරීමේ නිළධාරි

**අඩු ක්‍රමේ තමයි, මහත්තයෝ තෝරා ගන්නේ.** කොහොම හරි අතේ තියෙන තුට්ටු දෙක නිස්කාර නේ වියදම් කරන්න ඕනෑ නෑ.

රණ්බණ්ඩාට මොක ද සල්ලි වලින්, ගොවියෙක් කියත් ම සල්ලි කොහෙන් ද ඕයි ඔච්චර. මම ගිය ගමන පෝර ටික ගත්තෙත් සමූපෙට ණය වෙලා. හැබැයි පුතේ මම උඹලා තරම් පෝර දැම්මේ නැහැ. උඹලට සල්ලි වැඩි වෙලා හිතුමනාපෙට දම්මනේ. මම කන්තෝරුවෙන් එහෙම අහලා ප්‍රමාණයට දැම්මා. උන්නැහේලා කිව්වා ඕනෑවට වඩා පෝර දැම්මම ගොයම් පැලයට විසවෙනවා කියලාත්. උඹලාගේ කුඹුරු වලට උනේ ඒක. පෝර වුනත් නියම ප්‍රමාණයක් තියෙනවා නේ. ඒක දැම්මම හොඳට ම ඇති. පෝර කුඹුර පුරා ඇතිරුවත් ගහට ගන්න පුළුවන් ප්‍රමානේ තමයි ගන්නේ. තෙල්, බෙහෙත් ගැහිල්ල වුනත් එහෙම තමයි. අහල බලලා ප්‍රමාණෙට තමයි වැඩ. **යෙදවුම් යෙදීම සිහි නුවණින් කරන්න ඕනෑ වැඩක් නේද?**

රන්බණ්ඩා මහත්තයා ගොවිපල පටන් ගත්තේ කොහොමද? මගේ යාළුවෙක් ඇහුවා. මේක මම ගන්න කොටත් වගාකරලා තිබුණ එකක්. හිස් ඉඩමක් නෙවි. මම ටිකක් බැලුවා මේ පැත්ත මොන බෝග වලට ද හොඳ. අස්වැන්න කොහොමද, ලෙඩ රෝග නැත්ද, අස්වැන්න විකුණා ගැනීමේ දී අමාරු ද කියලා. වතුරත් කරදරයක් නැහැ. ඇල අයිනේ ම යි. අගල් කපලා හින්ද සෝද පාළුවකුත් නැහැ. ඇත්තටම මම හිතන් හිටියේ ඌරු කොටුවකුත් දමන්නයි. පස්සේ මට තේරුණා ඒකට නම් මේ පැත්ත හරි නැහැ කියලා. මොකද ටවුම පැත්තේ වැඩිය ඉන්නේ ඌරු මස් නොකන අය. ඒ ගමන තමයි කුකුල් කොටුව දැම්මේ. මහත්තයෝ හදන ඒවා විකුණා ගන්නත් එපායැ. ඉතින් ඕවා කන බොන මිනිස්සු. ඒ කිව්වේ **වටපිටාව ගැනත් තේරුමක් තියෙන්න ඕන.** සතුන් ගෙන් වන හානි, හොර හතුරු බිය ඔවත් සිහි කල්පනාවට ගන්න ඕන ප්‍රශ්න තමයි.

අනිත් කාරනේ මේ ගොල්ල දැන් මගේ විස්තර දන්නවා වගේ ම මම එයාල ගැනත් සොයනවා. මොක ද, ඒගොල්ලන් ගෙනුත් ඉගෙන ගන්න දේ තියෙනවා. ඇත්තට ම කුකුල් ජාවාරම ගැන මම හුඟක් දැනගත්තේ මේ මුතුබණ්ඩා ගෙන්නේ. සහෝදර ගොවි මහත්වරු කොරන දේවල් ගැන පොඩි දැනුමක්වත් ඕන. තනි අලියා වගේ වැඩ කොරල හරි යන්නේ නැහැ. කුඹුරුගොවි තැනට තමයි මේක හුඟක් වැදගත්. හැමෝම එක යායක එක ජාතියම වපුරනවා, නම් වැඩේ ලෙහෙසියි. එතකොට ලෙඩ රෝග වගේ දේවල් වුනත් මැඩ පවත්ත ගන්න එක හරි පහසුයි. ආදි කාලේ ඉඳලා කයියවල වැඩ කරලා තියෙන්නේ එකමුතුකමින් නේ. පැරැන්නන් කරපු දේවල් අපිට නිකම්ම අහක දමන්න බැහැ. ඒවාත් බොහොම කල්පනා කරල කොරපුවා.

දැන් මේ කතාවේ හැටියට රන්බණ්ඩා මහත්තයා හොඳ ගොවියෙක් බව පැහැදිලියි. ඉතින් අපිට කියන්න පුළුවන් ද පසුගිය කන්නවල ලබපු ආදායම් ගැන විස්තර ටිකක්. මම ඇහුවා. මම මේ වටපිට බැලුවේ මේ ගොල්ලට ඉරිසියා හිතෙයි ගණන් මීම් කිව්වාම. ඒක කොලොප්පමක්. ගෙදර පොතක මම සේරම විය හියදම් ලියලයි තියෙන්නේ. ගෙදරට යංකෝ මම පෙන්නන්නම්. **ඒ කිව්වේ වාර්කා පොතක්.** ඕක කියලා දුන්නේ උපදේශක මහත්තයෙක්. බිත්තර වී, තෙල් බෙහෙත්, පෝර,ට්‍රැක්ටර්, මී හරක්, මිනිස්සුන්ට ගිය කුළී, වගේ දේවල්ට ගිය වියදම් ඒකේ තියෙනවා. බෝගවලින් ගන්න ආදයම්. ඒවා විකුණපු කාලේ, ගොවිතැන ගැන විස්තරතියෙනවා. ඒක තමයි, මගේ අත්පොත. මිළ අඩු කාලෙට ඔය යෙදවුම් තෙල්බෙහෙත් අරන් තියා ගන්නවා. ඒ වගේ ම වැඩිම මුදලක් එන කාලෙට අස්වැන්න විකුණනවා. මිනිස්සු එන්නේ කජු කොල්ලෙට ගන්න තමයි. අපේ දඩිය මහන්සිය එහෙම නිකමට දෙන්න පුළුවනෑ. මට වැරදිච්ච, පාඩු වුණ හැටිත් එහෙම ඒකෙන් පේනවා.

කොටින්ම ගිය ගමන මම බිත්තර විකුණන්න හදන කොට මුතුබණ්ඩා කීවා දැන්ම එපා, නත්තල් කිට්ටුවෙනකන් තව සති දෙකක් විතර ඉමු. එතකොටයි වාසි කියලා. ඒක හරි ගියා. මේ ගමනත් ඒක තමයිකලේ.

(21 පිට බලන්න)

## ආවාට ගියාට ගොවිතැන්...

හැබැයි උන්දෑ ළඟ අනිත් විස්තර ලියා ගෙන නැහැ. මම එයාටත් කිව්වා වාර්තා පොතක් තියාගන්න කියලා. අකුරු බැරි නම් පොඩි එකෙකුට කියලාවත් ලියා ගන්න පුළුවන්නේ. ඔව් ඔව් මමත් මේ ගමන ඉඳලා ඔය රන් බණ්ඩාවගේ වාර්තා පොතක් තියා ගන්නවා, මුතු බණ්ඩා කීවා. දැන් කළුවරත් වැටී ගෙන එනවා. අපි යමුකෝ ගෙවල් දිහාවේ රණ් බන්ඩා කතාව හමාර කළා.

ඔය ටික කල්පනා කරලා බැලුවාම වැට හෙන්න ඕන හැමෝටම රණ්බණ්ඩා මහත්තය වගේ හොඳ ගොවි පලක් පටන් ගන්න එක අමාරු කාරියක් නොවේ කියලා. එයා තමන් ගේ ගොවිපල හොඳට පාලනය කරලයි කට යුතු කරල තියෙන්නේ. ඕකට තමයි අළුතින් **ගොවිපල කළමණාකාරිත්වය කියන්නේත්.** හොඳ කල්පනාවකින් ගොවිතැන් කිරිම තමයි ආවාට ගියාට නොකර කුඹුරේ හරි ගොඩ ඉඩමේ හරි වගා කිරිමට කළමණාකාරිත්වය නොවෙයි.

(9 පිට හා සම්බන්ධයි)

අපිට තියෙන සම්පත් නැතිනම් සාධක වන භූමිය, මුදල් ප්‍රමාණය හා ශ්‍රමය අපට තියෙන වගා පිළිවෙත් දැනුම, මිළ හා ඉල්ලුම, අවට පරිසරයේ ඒ කීවේ සමාජයීය හා දේශපාලන වාතාවරණය පිළිබඳ දැනුමක් එක්ක පැහිලා වැඩි ආදයමක් ලබා ගන්න වගා කරන එක තමයි.

මෙහෙම සැලැස්මකට වැඩ කරන්න ඕන තවත් හේතුවක් තියෙනවා. මොකද රටේ හැමෝටම ගොවිතැන් කරන්න තරම් ඉඩම් නැහැ. කැලෑ සියල්ල එළි කරන්නත් බැහැ. නමුත් රටේ හැමෝටම කන්න දෙන්න ඕන. එතකොට තමන් ගේ ඉඩමෙන් වැඩිම පලදා වක් ගැනීම තමයි උත්තරේ. එතකොට වැඩි පලදාව නැති අයට විකිණීම ආදයමක් ලැබීම විතරක් නොවෙයි, ආහාර සැපයීමෙන් ජාතික වගකීමක් ඉටු කිරිමකුත් වෙනවා. මේ සඳහා ගොවිපල කළමණාකාරිත්වය තමයි, නියම අත්වැල වෙන්නේ.